# සමාගම් අධ්‍යක්ෂවරයා පත් කර ගැනීමේ නව නීතිමය ඉඩකඩ

පී. ඥාණසිරි සිල්වා
නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස් සහ දිවුරුම් කොමසාරිස්.

1982 අංක 17 දරණ සමාගම් පනතේ සමාගම් අධ්‍යක්ෂක වරයා සම්බන්ධව ඇති 174 වගන්තියේ සඳහන් වන්නේ සෑම සමාගමකටම යටත් පිරිසෙයින් අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු සිටිය යුතු අතර සෑම පුද්ගලික සමාගමකම යටත් පිරිසෙයින් එක් අධ්‍යක්ෂක වරයෙකු සිටිය යුතු බවයි. මේ හැරුණුකොට සමාගම් පනතේ අධ්‍යක්ෂක වරයාගේ සුදුසුකම් පිළිබඳ කිසිදු සඳහනක් නැත.

සමාගම් අධ්‍යක්ෂක වරයාගේ සුදුසුකම් පිළිබඳ විමසූ නඩුවක් වන Re CityEquitable fire Insurance Companv නඩුවේදී ප්‍රකාශ වූයේ අධ්‍යක්ෂක වරයෙකුගෙන් සාමාන්‍ය දැනුමක් සහ පළපුරුද්දක් විනා ඉතා ඉහළ කාර්යක්ෂම බවක් අපේක්ෂා නොකරන බවයි. මේ නඩුතීන්දුව ලැබුණත් 1925 වර්ෂයට වඩා නූතන වානිජ ලෝකය දියුණු වී ඇති බැවින්, විශේෂයෙන්ම වානිජ තරගකාරීත්වය අතින් වර්ධනය වී ඇති බැවින් සමාගම් අධ්‍යක්ෂක වරයාගෙන් ඉතා ඉහල දැනුමක් සහ පළපුරුද්දක්, කැපවීමක් අපේක්ෂා කිරීම යුක්ති සහගතය.

අධ්‍යක්ෂකවරයා සිය පත්වීම ලැබ මාස දෙකක් ඇතුළත හෝ අල්පතර කාලයක් ඇතුළත සමාගම් ව්‍යවස්ථාවලියෙහි නියමකොට ඇති කොටස් සුදුසුකම ලබා නොගතහොත් ඔහු අධ්‍යක්ෂ ධූරය අතහැර ගියාසේ සැලකිය යුතු බව සමාගම් පනතේ 180 ( 3 ) වගන්තියේ සඳහන්ව ඇත.එසේම කොටස් සුදුසුකම ලබාගත් පසු නැවත අධ්‍යක්ෂක වරයෙකු ලෙස පත්වීම ලැබීමටත් යම් හෙයකින් සුදුසුකම් නොලබා අධ්‍යක්ෂකවරයෙකු ලෙස ක්‍රියා කළේ නම් දිනකට රු. 250/- ක් නොඉක්මවන දඩයකට යටත්වීමට ඔහුට සිදුවන බව සමාගම් පනතේ 180 (4) සහ (5) වගන්තිවල සඳහන්ය.

මේ සෑම අවස්ථාවකදීම සමාගම් අධ්‍යක්ෂ ධූරය සඳහන්ව ඇත්තේ ප්‍රමාණාත්මක වටිනාකමක් ඇති තනතුරක් ලෙසය. අධ්‍යක්ෂකවරයාගේ දැනීම සහ පළපුරුද්දට නොව ඔහු විසින් ගෙවනු ලබන කොටස් මුදල එම තනතුර ලබාගැනීමට අවශ්‍ය එකම සාධකය විය.

එහෙත් මේ ලිපියේ අරමුණ වන්නේ සමාගම් අධ්‍යක්ෂකවරයා සුවිශේෂී හැකියාවන්ගෙන් යුක්ත අයෙකුවීම අත්‍යාවශ්‍ය බව පෙන්වීමයි. විශේෂයෙන් මූල්‍ය කළමනාකරණය (ගණකාධිකාරවරයෙකුගේ කාර්ය භාරය නොවේ). සහ වෙළෙඳපල ගැන හොඳ දැනීමක් අධ්‍යක්ෂකවරයාට අවශ්‍යය. සමාගම යම් භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කරයි. එය අලෙවියට වෙළෙඳපලක් තිබිය යුතුය. අලෙවියෙන් ආදායමක් ලැබේ. එම ආදායම සමාගමේ පැවැත්ම මෙන්ම වර්ධනයට යොදා ගත යුතුය. සමස්ත සමාගම් ක්‍රියාවලියත් මේ ක්‍රියාවලිය තුළ අන්තර්ගතවී ඇති බව පැහැදිළි කරුණකි. මෙම ක්‍රියාවලිය හොඳින් සංවිධානය වී ඇත්නම් ඒ වටා ඇති ආනුෂංගික කරුණු වන අලෙවි ප්‍රවර්ධනය, මානව කළමනාකරණය , විගනණය ආදී කටයුතු සඳහා ධනාත්මක කරුණු අනිවාර්යයෙන්ම මතු වනු ඇත. මේ නිසා සාම්ප්‍රදායික හෝ සමාගම් පනතේ අර්ථකථනයන් හෝ සමාගම් පනතේ අධ්‍යක්ෂක වරයෙකුගේ අවශ්‍යතා මතුකොට දැක්වීම නූතන අවශ්‍යතාවක්ව පවතී.

අධ්‍යක්ෂ වරයා එක් අතකට සමාගමේ නියෝජිතයෙකි. අනෙක් අතට සමාගමේ භාර කාරයෙකි. එහෙත් මේ නියෝජිකත්වය හා භාරකාරත්ව සාමාන්‍ය නෛතික නිර්වචන වල සඳහන් ආකාරයට සලකා බැලිය යුතු නැති බව විශාරදයින්ගේ අදහසයි. අධ්‍යක්ෂවරයා භාරකාරත්ව දරන්නේ තම සමාගමේ මුදල් හා දේපළ සම්බන්ධයෙනි. නියෝජිතයෙකු වන්නේ එම සමාගම් සහ සම්බන්ධතාවයන් දක්වන පිටස්තරයින් සමගය. මෙහිදී අධ්‍යක්ෂවරයාට මූල්‍ය කළමනාකරණය පිළිබඳ විශේෂ දැනීමක් හැකියාවක් නැති සමාගමේ අනාගතය අවදානම් සහගතය. ඇතැම් සමාගම් අධ්‍යක්ෂකවරු මිලියන10 ක ව්‍යාපෘතියක් සැලසුම් කොට මිලියනය බැගින් යෙදවිය හැකි කොටස් කරුවන් 10 ක් සොයා ගෙන ව්‍යාපෘතිය පටන් ගනී. එම ව්‍යාපෘතියේ පරිපාලනය බාර ගන්නා ඉහත කී අධ්‍යක්ෂකවරයා පළමුවෙන්ම එම ව්‍යාපෘතියේ කටයුතු සඳහා මිලියන එකක් වටිනා වාහනයක් මිලට ගනී. දැන් ඔහු ව්‍යාපෘතිය පවත්වාගෙන යා යුත්තේ මිලියන නමයක මුදලකිනි. මීළඟට අපි අනුරාධපුරය වැනි ඈත පළාතක නුගත් ගොවි මහතෙකුගේ ක්‍රියාකාරකමක් විමසා බලමු. මේ ගොවියාට යල කන්නයේ තම ගොවි බිම වගා කිරීම සඳහා රු. 7500/- ක මුදලක් අවශ්‍යයයි සිතමු. රාජ්‍ය බැංකුවක් නම් මේ මුදල ලබා දීමට එකඟ වේ. අනුරාධපුර නගරයට පැමිණෙන මේ ගොවියා අවශ්‍ය ලියවිලි අත්සන් කොට මුදල ලබා ගනී. ඔහු ප්‍රථමයෙන්ම කරන්නේ කඩයට ගොස් කුඩා රේඩියෝවක් මිලයට ගැනීමයි. එසේම තමන්ට වැඩිවිය පත් දුවක් සිටිනම් කුඩා කරාබු ජෝඩුවක්ද මිලයට ගනු ඇත. මේ සඳහා රු.1000/- ක් වියදම් වූයේ යැයි සිතමු. දැන් ඔහුට ඇත්තේ රු. 500/- ක් පමණි. එම මුදල යොදා, ගත් ණය මුදලට සමාන වගාවක් කිරීමට හෝ ණය මුදලේ